සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

22 S I

2019.08.28 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ..............................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. **I කොටස** බහුවරණ ප්‍රශ්න **40** කින් සමන්විත වන අතර, ඒවාට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සැපයිය යුතු ය.
* **I** කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
* **II** කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* **III** කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* **I, II** සහ **III** කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු ය.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| I කොටස | 1 - 40 | |
| II කොටස | 1 | |
| | 2 | |
| III කොටස | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

tamilguru.lk

## I කොටස

- ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර අඩංගු වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ ඇති **තිත් ඉර** මත ලියන්න.

**1.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් භූ ලක්ෂණ සිතියමක ඇති සමෝච්ඡ රේඛා පිළිබඳ ව නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) සමෝච්ඡ රේඛා මගින් භූමියේ සියලු භෞතික ලක්ෂණ නිරූපණය කරයි.
(2) සමෝච්ඡ රේඛා අඳිනු ලබන්නේ 40 m ක අන්තරයකිනි.
(3) සෑම අවස්ථාවක දී ම සමෝච්ඡ රේඛා දැක්වෙන්නේ තිත් ඉරි මගිනි.
(4) සමෝච්ඡ රේඛා මගින් භූමියේ සමාන උච්ඡත්ව යා කර පෙන්වයි.
(5) සමෝච්ඡ රේඛා සෘජු රේඛා ලෙස ඇඳ ඇත. (......)

**2.** ශ්‍රී ලංකාවේ 1: 50,000 භූ ලක්ෂණ සිතියමක මුහුණතෙහි දිග පළල වන්නේ,
(1) 40 cm × 25 cm (2) 50 cm × 30 cm (3) 60 cm × 40 cm
(4) 70 cm × 40 cm (5) 80 cm × 50 cm (......)

3. පර්යේෂණයක දී යොදා ගන්නා ප්‍රධාන දත්ත වර්ග දෙකක් වන්නේ,
   (1) සිතියම් හා ගුවන් ඡායාරූප ය.
   (2) සංගණන වාර්තා හා පුවත්පත් ය.
   (3) ප්‍රාථමික හා ද්විතීයික ය.
   (4) සමීක්ෂණ හා මිනුම් ය.
   (5) නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා ය. (……)

4. නිරීක්ෂණය මගින් රැස් කළ දත්තවලට උදාහරණයක් වනුයේ,
   (1) වී වගා කිරීම සඳහා භාවිත යෙදවුම් ප්‍රමාණයයි.
   (2) ග්‍රාම නිලධාරී කොට්ඨාශයක ජන සංඛ්‍යාවයි.
   (3) සුපිරි වෙළෙඳසැලක් තුළ පාරිභෝගික චර්යාවයි.
   (4) කාර්යාලයීය කාර්ය සහයකයින්ගේ අධ්‍යාපන මට්ටමයි.
   (5) කුටුම්භයක ආදායම් මාර්ගයි. (……)

More Past Papers at
tamilguru.lk

5. භූගෝලීය තොරතුරු පද්ධතියක සෘජුවම භාවිතයට ගත හැකි දත්ත යුගලය වන්නේ,
   (1) චන්ද්‍රිකා ප්‍රතිබිම්බ හා සුපරීක්ෂණ (Scanned) දත්ත ය.
   (2) දෛශික (Digital) දත්ත හා මුද්‍රිත දත්ත ය.
   (3) සුපරීක්ෂණ දත්ත හා දෛශික දත්ත ය.
   (4) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති (GPS) දත්ත හා සන්තතික දත්ත ය.
   (5) ඛණ්ඩාංක හා දෛශික දත්ත ය. (……)

6. භූ ලක්ෂණ සිතියමක ඇති භෞතික ලක්ෂණ දෙකක් වන්නේ,
   (1) උන්නතාංශය හා ජල සම්පාදනයයි.
   (2) භෝග වගාව හා ජල සම්පාදනයයි.
   (3) ජලවහනය හා මාර්ග පද්ධතියයි.
   (4) භූ විෂමතාව හා ජලවහනයයි.
   (5) ජල සම්පාදනය හා මාර්ග පද්ධතියයි. (……)

7. අංකිත සිතියම් සකස් කිරීම සඳහා යොදා ගනු ලබන උපකරණයක් වන්නේ,
   (1) මාලිමාවයි.
   (2) තියෝඩලයිටයයි.
   (3) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති (GPS) ග්‍රාහකයයි.
   (4) සුපරීක්ෂණයයි (Scanner).
   (5) මිනුම්පටියයි. (……)

8. නගරයක ජන සංයුතිය නිරූපණය කිරීම සඳහා වඩාත් සුදුසු වන්නේ,
   (1) ජාල රේඛයයි.
   (2) බෙදන ලද වෘත්ත ප්‍රස්තාරයයි.(pie graph).
   (3) රේඛා ප්‍රස්තාරයයි.
   (4) තිත් සිතියමයි.
   (5) විසරණ සටහනයි. (……)

9. රේඛා සහ තීරු (bars) ලෙස එකම ප්‍රස්තාරයකින් දැක්විය හැකි දත්ත වනුයේ,
   (1) ජන ඝනත්වය සහ ජන ව්‍යාප්තියයි.
   (2) වර්ෂාපතනය හා උෂ්ණත්වයයි.
   (3) භූමි පරිභෝජනය හා ජනගහනයයි.
   (4) ආනයනය හා අපනයනයයි.
   (5) ආගමනය හා විගමනයයි. (……)

10. දත්ත ව්‍යාප්තියක විචලනය පන්ති ප්‍රාන්තර අනුව සකස් කර ඉදිරිපත් කරනු ලබන සිතියම් ක්‍රමයක් වන්නේ,
   (1) රේඛාංකිත සිතියමයි.
   (2) භූ ලක්ෂණ සිතියමයි.
   (3) ධාරා සිතියමයි.
   (4) තිත් සිතියමයි.
   (5) සම සංඛ්‍යා සිතියමයි. (……)

11. පහත දැක්වෙන ඒවා අතුරෙන් පළමු ගණයේ භූ රූප දෙකක් දැක්වෙන වරණය කුමක් ද?
   (1) ගිනි කඳු හා කඳු වැටි
   (2) මහද්වීපික බෑවුම් හා පළිහ ප්‍රදේශ
   (3) මහද්වීප හා සාගර
   (4) කඳු වැටි හා පළිහ ප්‍රදේශ
   (5) මහද්වීප හා දූපත් (……)

12. ආවෘත පද්ධතියකට උදාහරණයක් වනුයේ,
   (1) සෞරග්‍රහ මණ්ඩලයයි.
   (2) ජෛවීය පද්ධතියයි.
   (3) නිවර්තන වැසි වනාන්තර පද්ධතියයි.
   (4) ජලවහන ද්‍රෝණියයි.
   (5) තෘණ භූමි පරිසර පද්ධතියයි. (……)

**13.** පෘථිවියේ ප්‍රාවරණය හරයෙන් වෙන් කොට දක්වන ගුටෙන්බර්ග් අසන්තතිය පිහිටා ඇත්තේ පෘථිවි මතුපිට සිට කොපමණ ගැඹුරකින් දැයි නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) 1550 km (2) 1750 km (3) 2100 km (4) 2200 km (5) 2990 km (……)

**14.** ශක්ති ඛනිජයක් දැක්වෙන වරණය කුමක් ද?
(1) මොනසයිට් ය. (2) ක්රෝමියම් ය. (3) ෆෙල්ඩ්ස්පාර් ය.
(4) මැග්මටයිට් ය. (5) ලිමොනයිට් ය. (……)

**15.** විපරිත පාෂාණයකට උදාහරණයක් දැක්වෙන වරණය කුමක් ද?
(1) ග්රැනයිට් (2) හුණු ගල් (3) ෂිස්ට්
(4) ක්වාර්ට්සයිට් (5) වැලි ගල් (……)

**16.** අපසාරි චලන නිසා නිර්මාණය වූ භූ ලක්ෂණයකට උදාහරණයක් වන්නේ,
(1) මධ්‍ය සාගරික වැටි ය. (2) හිමාලයා කඳු වැටිය ය.
(3) මරියානා ආගාධය ය. (4) හවායි දූපත් ය.
(5) රොකී කඳු ය. (……)

**17.** භූමි කම්පාවලින් බහුතරයක් හටගන්නා පෘථිවියේ ප්‍රධාන කලාපය කුමක් ද?
(1) පැසිපික් වළල්ල කලාපය (2) මධ්‍යධරණී හිමාලය කලාපය
(3) මධ්‍ය අත්ලාන්තික් සාගරික කලාපය (4) අප්‍රිකානු සුවිභේද නිම්න කලාපය
(5) දකුණු ඇමෙරිකානු කලාපය (……)

**18.** විසුවියස් යමහල පිහිටා ඇති රට කුමක් ද?
(1) පිලිපීනය (2) ඉන්දුනීසියාව (3) ජපානය
(4) ඉතාලිය (5) මෙක්සිකෝව (……)

**19.** පහත දැක්වෙන වරණ අතුරෙන් ආක්‍රාන්ත යමහල් භූ ලක්ෂණයක් සඳහා උදාහරණයක් වන්නේ,
(1) කල්දෙරාව ය. (2) යමහල් කේතු ය. (3) ලාවා සානු ය.
(4) ඩයික ය. (5) සංයුක්ත කේතු ය. (……)

**20.** ශ්‍රී ලංකාවේ පළමුවන අන්තර්-මෝසම් වර්ෂාව ලැබෙන කාල පරිච්ඡේදය වන්නේ,
(1) මාර්තු - අප්‍රේල් වේ. (2) අගෝස්තු - සැප්තැම්බර් වේ.
(3) ඔක්තෝම්බර් - නොවැම්බර් වේ. (4) අප්‍රේල් - මැයි වේ.
(5) නොවැම්බර් - දෙසැම්බර් වේ. (……)

**21.** ශ්‍රී ලංකාවේ උපරිම වර්ෂාපතනයක් වාර්තා වන ස්ථානය වන්නේ,
(1) යටියන්තොට ය. (2) හැටන් ය. (3) වටවල ය.
(4) මාලිබොඩ ය. (5) තලවාකැලේ ය. (……)

**22.** පහත දැක්වෙන වරණ අතුරෙන් හරිතාගාර වායු විමෝචනයේ ප්‍රධාන මූලාශ්‍ර තුනක් අවරෝහණ ක්‍රමයට දැක්වෙන්නේ කුමන වරණයෙහි ද?
(1) ශක්ති පථය, කාර්මික පථය, වනහරණය
(2) ශක්ති පථය, ප්‍රවාහන පථය, කෘෂිකර්ම පථය
(3) කාර්මික පථය, වනහරණය, ප්‍රවාහන පථය
(4) කෘෂිකර්ම පථය, ප්‍රවාහන පථය, කාර්මික පථය
(5) වනහරණය, කෘෂිකර්ම පථය, ප්‍රවාහන පථය (……)

**23.** කිසියම් ප්‍රදේශයක දේශගුණය නිර්ණය කිරීම සඳහා කොපමණ වර්ෂ සංඛ්‍යාවක කාලගුණික දත්ත අවශ්‍ය වන්නේ ද?
(1) වර්ෂ 15 (2) වර්ෂ 20 (3) වර්ෂ 30 (4) වර්ෂ 40 (5) වර්ෂ 50 (……)

**24.** පහත දැක්වෙන වරණ අතුරෙන් නිවර්තන වැසි වනාන්තර පිහිටා ඇති ප්‍රදේශ දැක්වෙන්නේ කුමන වරණයෙහි ද?
(1) ආසියාව, අප්‍රිකාව, දකුණු ඇමෙරිකාව හා පැසිපික් සාගරික දූපත්
(2) ඔස්ට්‍රේලියාව, අප්‍රිකාව, දකුණු ඇමෙරිකාව හා මැඩගස්කර්
(3) ආසියාව, අප්‍රිකාව, උතුරු ඇමෙරිකාව හා මධ්‍යම ඇමෙරිකාව
(4) ආසියාව, දකුණු ඇමෙරිකාව, දකුණු යුරෝපය හා පැසිපික් සාගරික දූපත්
(5) දකුණු අප්‍රිකාව, චීනය, දකුණු ඇමෙරිකාව හා පැසිපික් සාගරික දූපත් (……)

[හතරවැනි පිටුව බලන්න.

25. ශ්‍රී ලංකාවේ දෙවැනි දිගම ගංගාව වන්නේ,
(1) කළු ගඟ ය. (2) කලා ඔය ය. (3) මල්වතු ඔය ය.
(4) කැලණි ගඟ ය. (5) වළවේ ගඟ ය. (……)

26. ජන සංඛ්‍යාව වියපත් වීමට හේතු වන සාධක දෙකක් ඇතුළත් නිවැරදි වරණය කුමක් ද?
(1) ආයු අපේක්ෂාව ඉහළ යාම සහ සාඵල්‍යතාව ඉහළ යාම.
(2) ආයු අපේක්ෂාව පහළ යාම සහ මරණ ශීඝ්‍රතාව අඩු වීම.
(3) ආයු අපේක්ෂාව ඉහළ යාම සහ සාඵල්‍යතාව පහළ බැසීම.
(4) ආයු අපේක්ෂාව පහළ යාම සහ විවාහ ශීඝ්‍රතාව පහළ යාම.
(5) ආයු අපේක්ෂාව ඉහළ යාම සහ විවාහ ශීඝ්‍රතාව ඉහළ යාම. (……)

27. 'බ්ලූ බනානා' (blue banana) නමින් හැඳින්වෙන නාගරික-කාර්මික වේදිකාව විහිදෙන්නේ,
(1) චිකාගෝ සිට පිට්ස්බර්ග් දක්වා ය.
(2) බොස්ටන් සිට වොෂිංග්ටන් දක්වා ය.
(3) වයඹදිග එංගලන්තයේ සිට ජිනෝවා දක්වා ය.
(4) ටෝකියෝ සිට ඔසාකා දක්වා ය.
(5) ග්ලාස්ගෝ සිට බුඩාපෙස්ට් දක්වා ය. (……)

28. ප්‍රාථමික ආර්ථික ක්‍රියාකාරකම් දෙකක් ඇතුළත් නිවැරදි වරණය වන්නේ,
(1) කෘෂිකර්මය සහ නිෂ්පාදන කර්මාන්තයයි.
(2) ආකර කර්මාන්තය සහ මසුන් මැරීමයි.
(3) ආකර කර්මාන්තය සහ ප්‍රවාහනයයි.
(4) කෘෂිකර්මය සහ වෙළෙඳාමයි.
(5) මසුන් මැරීම සහ නිෂ්පාදන කර්මාන්තයයි. (……)

29. බහුජාතික සමාගමක් යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) විවිධ ජාතීන්ට අයත් පුද්ගලයන් කණ්ඩායමක් විසින් ක්‍රියාත්මක කරන සමාගමකි.
(2) බොහෝ සංවර්ධනය වන රටවල කර්මාන්ත සඳහා මුදල් ආයෝජනය කිරීමට පිහිටු වූ සමාගමකි.
(3) මව් රටේ පිහිටි සමාගමට අතිරේක වෙනත් රටවල ද ශාඛා පිහිටුවා ඇති සමාගමකි.
(4) ලෝක වෙළඳ සංවිධානය විසින් පිහිටුවා ඇති සමාගමකි.
(5) ඉහළ වටිනාකමක් ඇති භාණ්ඩ සමුදායක් නිපදවන සමාගමකි. (……)

30. වගාවට යොදවා ඇති භූමි ප්‍රමාණය ප්‍රසාරණය සීමා වීමට හේතුව වන්නේ,
(1) බොහෝ සංවර්ධනය වන රටවල කෘෂිකාර්මික තාක්ෂණය හිඟ වීම ය.
(2) ලෝකයේ වගාවට ගත හැකි භූමියෙන් වැඩි ප්‍රමාණයක් දැනටමත් ඒ සඳහා යොදවා තිබීම ය.
(3) ගොවීන් වශයෙන් රැකියා කිරීමට කැමති තරුණ අය අඩු වීම ය.
(4) රජයට අයත් භූමිය වගාව සඳහා යෙදවීමට රජය අකමැති වීම ය.
(5) කෘෂිකාර්මික භූමිය ප්‍රසාරණය කිරීම ගෝලීය උණුසුම් වීම නිසා සීමා වීම ය. (……)

31. නාගරික ජනාවාස ධුරාවලියේ පහළ ම හා සංකීර්ණත්වයෙන් අඩු ම ජනාවාසය වන්නේ,
(1) ගොවිපොළ ය. (2) ගම ය. (3) නගරය ය.
(4) කුඩා ගම ය. (5) පුරවරය ය. (……)

32. පහත දැක්වෙන පිළිතුරු අතුරෙන් ජනසංඛ්‍යාවක ඇති ලක්ෂණ හතරක් දැක්වෙන වරණය කුමක් ද?
(1) උපත්, මරණ, සංක්‍රමණය හා වර්ධනය
(2) උපත්, මරණ, ආගමනය හා විගමනය
(3) සාඵල්‍යතාව, මෘත්‍යතාව, සංයුතිය හා සංක්‍රමණය
(4) විශාලත්වය, ව්‍යාප්තිය, සංයුතිය සහ වර්ධනය
(5) විශාලත්වය, ව්‍යුහය, ස්වාභාවික වර්ධනය සහ සංක්‍රමණය (……)

33. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අයත්වන්නේ පහත දැක්වෙන කුමන නගර වර්ගයට ද?
(1) සංස්කෘතික (2) පරිපාලන (3) නේවාසික
(4) කාර්මික (5) වාණිජ (……)

[පස්වැනි පිටුව බලන්න.

**34.** දකුණු ආසියාවේ අධිකතම නාගරික ජනසංඛ්‍යා ප්‍රතිශතයක් සහිත රට වන්නේ,
(1) ඉන්දියාවයි. (2) ශ්‍රී ලංකාවයි. (3) බංග්ලාදේශයයි.
(4) මාලදිවයිනයි. (5) පකිස්තානයයි. (……)

**35.** පහත දැක්වෙන වරණ අතුරෙන් පුම්තිරි අනුපාතය විස්තර කරන්නේ කුමන වරණයෙහි ද?
(1) ජනසංඛ්‍යාවේ ස්ත්‍රීන් 100 කට සිටින පුරුෂයින් සංඛ්‍යාව
(2) ජනසංඛ්‍යාවේ පුරුෂයින් 100 කට සිටින ස්ත්‍රීන් සංඛ්‍යාව
(3) ජනසංඛ්‍යාවේ ස්ත්‍රීන් 1000 කට සිටින පුරුෂයින් සංඛ්‍යාව
(4) ජනසංඛ්‍යාවේ පුරුෂයින් 1000 කට සිටින ස්ත්‍රීන් සංඛ්‍යාව
(5) ජනසංඛ්‍යාවේ ස්ත්‍රීන් 10 කට සිටින පුරුෂයින් සංඛ්‍යාව (……)

**36.** පහත දැක්වෙන වරණ අතුරෙන් ශ්‍රී ලංකාවේ මිනිරන් නිෂ්පාදනයේ කැපී පෙනෙන ලක්ෂණයක් නිවැරදිව දැක්වෙන්නේ කුමන වරණයෙහි ද?
(1) නිෂ්පාදනයෙන් අධික ප්‍රමාණයක් දේශීය කර්මාන්ත විසින් ප්‍රයෝජනයට ගනී.
(2) නිෂ්පාදන පිරිවැය පහළ යමින් පවතී.
(3) නිෂ්පාදනයෙන් 99% ක් ම අපනයනය කෙරේ.
(4) නිෂ්පාදන ක්‍රියාවලිය අධික ලෙස යාන්ත්‍රීකරණයට පත්ව ඇත.
(5) පෞද්ගලික අංශය නිෂ්පාදනයට හවුල් වී නොමැත. (……)

**37.** ජනාවාසයක ඉතා වැදගත් සංරචකය කුමක්ද?
(1) සමාජය (2) නිවාස (3) ජාල (4) මිනිසා (5) පරිසරය (……)

**38.** 1987 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ නාගරික පරිපාලන ඒකකයක් වශයෙන් සලකනු **නොලැබුවේ,**
(1) සුළුනගර සභා ය. (2) ප්‍රාදේශීය ආදායම් පාලක කොට්ඨාස ය.
(3) මහනගර සභා ය. (4) උපදිසාපති කොට්ඨාස ය.
(5) නගර සභා ය. (……)

**39.** ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ජනසංඛ්‍යාවේ ගතිලක්ෂණ සම්බන්ධ නිවැරදි පිළිතුර කුමක් ද?
(1) අධික ජනසංඛ්‍යාව හා ඉහළ ජනසංඛ්‍යා වර්ධන ශීඝ්‍රතාව ය.
(2) අඩු ජනසංඛ්‍යාව හා පහළ ජනසංඛ්‍යා වර්ධන ශීඝ්‍රතාව ය.
(3) අධික ජනසංඛ්‍යාව හා පහළ ජනසංඛ්‍යා වර්ධන ශීඝ්‍රතාව ය.
(4) අධික ජනගණත්වය හා ඉහළ ජනසංඛ්‍යා වර්ධන ශීඝ්‍රතාව ය.
(5) අඩු ජනගණත්වය හා පහළ ජනසංඛ්‍යා වර්ධන ශීඝ්‍රතාව ය. (……)

**40.** ආකර කර්මාන්තය නිෂ්කර්ශක කර්මාන්තයක් වශයෙන් හැඳින්වීමට හේතුව කුමක් ද?
(1) යකඩ සහ වානේ කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය මෙමගින් සැපයීම නිසා ය.
(2) ඛනිජ සම්පත් කැණීමට සීමා වූ කර්මාන්තයක් නිසා ය.
(3) ඛනිජ සම්පත් බහුල ප්‍රදේශවල කෙරෙන කර්මාන්තයක් නිසා ය.
(4) සාරාගන්නා ඛනිජවලින් විශාල ප්‍රමාණයක් නිෂ්කාශනය කරන නිසා ය.
(5) සාරාගන්නා ඛනිජවලින් විශාල ප්‍රමාණයක් ප්‍රාථමික ආර්ථික ක්‍රියාකාරකම්වලට යොදවන නිසා ය. (……)

* *

More Past Papers at
tamilguru.lk

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

22 S I

II කොටස – ප්‍රශ්න අංකය 1. (iii)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

22 S I

උපදෙස්:

* II කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* III කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1 : 50,000 ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියමේ කොටසක් ද ලෝක ආකෘති සිතියමක් ද ප්‍රස්තාර කඩදාසි **දෙකක්** ද සපයනු ලැබේ.

## II කොටස

● ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1 : 50,000 පරිමාණයේ දඹුල්ල භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය මීටර 20 කි. එම සිතියම පදනම් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සැලකිය යුතුයි:

* **පිළිතුරු සිතියමෙහි ලිවිය යුතු නො වේ.**
* **ප්‍රශ්න අංකය** සහ අදාළ **උප කොටස්වල අංක** පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
* සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු **නො වේ**.

**1.** (i) **AB** සහ **CD** රේඛා දෙක මගින් දක්වා ඇති භූ රූප ලක්ෂණ **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) **E** සහ **F** චතුරස්‍ර මගින් දක්වා ඇති ජලවහන ලක්ෂණය හා භූ රූප ලක්ෂණය පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) **G** සහ **H** සම්බන්ධ කෙරෙන රේඛාව ඔස්සේ හරස්කඩක් (cross section) අඳින්න. (මේ සඳහා 6 වන පිටුවෙහි දී ඇති ප්‍රස්තාර කඩදාසිය යොදා ගන්න.) (ලකුණු 03 යි)

(iv) එම හරස්කඩින් දැක්වෙන ප්‍රදේශයේ භූ විෂමතාව සහ භූමි පරිහරණය අතර සබඳතාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

(v) සිතියම් ප්‍රදේශයෙහි භූ විෂමතා ලක්ෂණ සහ ප්‍රවාහන ජාලය අතර සබඳතාව සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

(vi) සිතියමේ **J** ලෙස ලකුණු කර ඇති චතුරස්‍රයෙහි දැක්වෙන ප්‍රදේශයේ භූමි පරිහරණයෙහි ස්වභාවය විස්තර කරන්න. (ලකුණු 05 යි)

**2.** ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි සම්මත සංකේත හා වර්ණ යොදාගනිමින් පහත සඳහන් දෑ **ලකුණු** කර **නම්** කරන්න.

(i) රොකී කඳු
(ii) හොවැංහෝ ගංගාව
(iii) කලහාරි කාන්තාරය
(iv) එරල් මුහුද (විල)
(v) සයිප්‍රස් දූපත
(vi) මලක්කා සමුද්‍ර සන්ධිය
(vii) ග්‍රිනිච් මධ්‍යාහ්න රේඛාව
(viii) ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය පිහිටි නගරය
(ix) චීනයෙහි අධික ලෙස වායු දූෂණයට ලක්වී ඇති නගරය
(x) ලතින් ඇමෙරිකාවේ ප්‍රධානතම යපස් නිෂ්පාදන රට

(ලකුණු 10 යි)

[අවවැනි පිටුව බලන්න.

මෙතැනින් කපන්න

## III කොටස

**3.** (i) දත්ත සහ තොරතුරු අතර වෙනස දක්වන්න. (ලකුණු 02 යි)

(ii) ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත අතර වෙනස සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි)

(iii) ප්‍රාථමික දත්ත රැස්කරනු ලබන ක්‍රම **හතරක්** හඳුන්වන්න. (ලකුණු 04 යි)

(iv) ප්‍රාථමික දත්ත රැස්කිරීමේ දී මුහුණ දෙන ගැටලු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** (i) සිතියමක් (map) යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) විශාල පරිමාණයේ සිතියමක් සහ කුඩා පරිමාණයේ සිතියමක් අතර වෙනස දක්වන්න. (ලකුණු 02 යි)

(iii) භූ ලක්ෂණ සිතියමකින් ඇති ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) තේමා සිතියම්වල වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**5.** 2009 සහ 2012 වර්ෂවල දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කාර්මික අංශයේ දායකත්වය **වගුව 1** හි දැක්වේ.

**වගුව 1:** 2009 සහ 2012 වර්ෂවල දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කාර්මික අංශයේ දායකත්වය (රුපියල් මිලියනවලින්)

| | **කාර්මික අංශය** | **2009** | **2012** |
|---|---|---|---|
| 1 | ආකර කැනීම් | 60 079 | 84 672 |
| 2 | නිෂ්පාදනය කිරීම් | 458 660 | 520 938 |
| 3 | විදුලිය, ගෑස් හා ජලය | 63 567 | 72 634 |
| 4 | ඉදිකිරීම් | 177 912 | 247 091 |

**මූලාශ්‍රය:** ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (2012)

(i) 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කාර්මික අංශයේ දායකත්වය දැක්වීම සඳහා බෙදන ලද වෘත්ත ප්‍රස්තාරයක් අඳින්න. (මේ සඳහා වෙනම ප්‍රස්තාර කඩදාසියක් ලබා ගන්න.) (ලකුණු 05 යි)

(ii) ඔබ අඳින ලද ප්‍රස්තාරයෙහි වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කාර්මික අංශයේ දායකත්වයෙහි කැපීපෙනෙන ලක්ෂණ **දෙකක් වගුව අංක 1** හි දත්ත ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

(iv) **වගුව අංක 1** හි දත්ත ඉදිරිපත් කළ හැකි වෙනත් සිතියම් විද්‍යාත්මක ක්‍රමයක් යෝජනා කර එහි යෝග්‍යතාව කරුණු **දෙකක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)


**6.** (i) නවීන සිතියම් විද්‍යාව යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) භූගෝලීය තොරතුරු පද්ධතියෙහි ආදාන උපාංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (Global Poisitioning System) ඇති සිතියම් විද්‍යාත්මක ප්‍රයෝජන **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්පයෙහි පවත්නා වාසි **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

* * *




SCALE 1 : 50,000

සමෝච්ච රේඛා අන්තරය මීටර 20
சமவுயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்
Contour Interval 20 metres

32800

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

NEW අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019


ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 2

භූගෝල විද්‍යාව I / புவியியல் I / Geography I

II කොටස / பகுதி II / PART II

22 STE I

විභාග අංකය / சுட்டெண் / Index No ..........................



32800

AL/2019/22/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

| | | | |
|---|---|---|---|
| භූගෝල විද්‍යාව II<br>புவியியல் II<br>Geography II | 22 S II | 2019.08.29 / 1300 - 1610 |

| | |
|---|---|
| පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි<br>மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**
* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

**1.** (i) අන්තර්ජන්‍ය බලවේග හා බහිර්ජන්‍ය බලවේග යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශිලා ගෝලය තුළ ක්‍රියාත්මක වන සම්පීඩන බලවේග මගින් නිර්මාණය වන නැමි වර්ග **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශිලා ගෝලය තුළ ක්‍රියාත්මක වන ආතතීය බලවේග මගින් නිර්මාණය වන විභේද වර්ග **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ඉහළ අක්ෂාංශීය ප්‍රදේශවල ක්‍රියාත්මක වන ප්‍රධාන බහිර්ජන්‍ය බලවේගයක් නිසා නිර්මාණය වන භූ ලක්ෂණ **තුනක්** සුදුසු රූපසටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**2.** (i) ගංගා නිම්නයක සිදුවන ඛාදනය කෙරෙහි බලපාන සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ගංගා නිම්නයක ඛාදනය සිදුවන ක්‍රම **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) ගංගා නිම්නයක ඉහළ කොටසේ දක්නට ලැබෙන භූ ලක්ෂණ **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ගංගා නිම්නයක පහළ කොටසේ දී නිධි සාධනය නිසා නිර්මාණය වන භූ ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) දේශගුණ වෙනස්වීම් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි දක්වන්න. (ලකුණු 02 යි)

(ii) දේශගුණ වෙනස්වීම්වලට දායකවන ස්වාභාවික සාධක **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ගෝලීය දේශගුණ වෙනස්වීම් මානුෂ ක්‍රියාකාරකම් කෙරෙහි බලපාන ආකාරය උදාහරණ **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) දේශගුණ වෙනස්වීම්වල අහිතකර බලපෑම් අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) ජල චක්‍රය තුළ ජලය පවත්නා ස්වරූප **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ලෝකයේ ජල සම්පත්වල ගුණාත්මකභාවය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ ජල සම්පත තීරණය කෙරෙන ප්‍රධාන භෞතික සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) දිවයිනේ ජල සම්පත සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියා මාර්ග **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

**5.** **වගු අංක 1 : ජාත්‍යන්තර සංක්‍රමණය 1990 -2017**

| වර්ෂය | ජාත්‍යන්තර සංක්‍රමණිකයන්ගේ මුළු සංඛ්‍යාව (මිලියන) | සංවර්ධිත රටවල් තුළ (මිලියන) | මුළු සංක්‍රමණික සංඛ්‍යාවෙන් % ලෙස | සංවර්ධනය වන රටවල් තුළ (මිලියන) | මුළු සංක්‍රමණික සංඛ්‍යාවෙන් % ලෙස |
|---|---|---|---|---|---|
| 1990 | 152.5 | 82.4 | 54.0 | 70.1 | 46.0 |
| 1995 | 160.7 | 92.3 | 57.4 | 68.4 | 42.6 |
| 2000 | 172.6 | 103.4 | 59.9 | 69.2 | 40.1 |
| 2005 | 190.5 | 116.3 | 61.0 | 74.2 | 39.0 |
| 2010 | 220.0 | 130.7 | 59.4 | 89.3 | 40.6 |
| 2015 | 247.6 | 140.3 | 56.7 | 107.3 | 43.3 |
| 2017 | 257.7 | 146.0 | 56.7 | 111.7 | 43.3 |

මූලාශ්‍රය : United Nations, Department of Economic and Social Affairs, Population Division, Trends in International migrant stock - 2017

(i) **වගු අංක 1**න් හඳුනාගත හැකි ජාත්‍යන්තර සංක්‍රමණයේ කැපී පෙනෙන ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) සංවර්ධිත රටවල් කරා සංක්‍රමණය වීමට ජනතාව පොළඹවන සාධක **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) සංක්‍රමණය නිසා ගමනාන්ත ප්‍රදේශවල හටගන්නා සමාජ-ආර්ථික වෙනස්වීම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ ජනව්‍යාප්තිය කෙරෙහි සංක්‍රමණය බලපා ඇති ආකාරය නිදසුන් **තුනක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**6.** (i) ශ්‍රී ලංකාවේ පාරිභෝගික (subsistence) කෘෂිකර්මාන්තයෙහි කැපී පෙනෙන ලක්ෂණ **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ශ්‍රී ලංකාවේ භාවිත කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රමවේද **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත (ii) (අ) හි නම් කළ **එක්** තාක්ෂණ ක්‍රමවේදයක් තෝරා ගෙන එය ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ සංවර්ධනයට දායක වී ඇති ආකාරය නිදසුන් **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිකරණයේ ගති ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) වර්තමානයේ දී ලෝක කෘෂිකර්මාන්තය මුහුණ දෙන ප්‍රධාන අභියෝග **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

**7.** (i) කර්මාන්ත ස්ථානගතවීමේ සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි ඔබ සඳහන් කළ **එක්** සාධකයක් තෝරා ගෙන එය කර්මාන්ත ස්ථානගතවීම කෙරෙහි බලපා ඇති ආකාරය නිදසුන් **තුනක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) කර්මාන්ත ස්ථානගතවීමේ සාධකවල මෑතකාලීන ප්‍රවණතා **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ඇඟලුම් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වී ඇති ආකාරය උදාහරණ **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

[තුන්වැනි පිටුව බලන්න.

**8.** (i) 'ගෝලීයකරණය' නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ii) ගෝලීයකරණ ක්‍රියාවලිය වේගවත් කරන සාධක **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය කෙරෙහි ගෝලීයකරණය දායක වී ඇති ආකාරය උදාහරණ **තුනක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ගෝලීයකරණය විසින් සංවර්ධනය වන රටවල නිර්මාණය කර ඇති ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

* * *

More Past Papers at
tamilguru.lk